**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - 2016**

**-----------------------------------------------------------------**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයේ සාමාජිකයන් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

**තත්ත්වාගණනය කළ මතය - සමූහය**

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - මණ්ඩලය**

------------------------------------------

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2016 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

-------------------------------------------------

පරිපාලිතයක් අත්පත් කර ගැනීමේදී උද්ගත වන කීර්තිනාමය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත යුතු අතර එම අස්පෘශ්‍ය වත්කම සම්බන්ධයෙන් හානිකරණයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව වාර්ෂිකව පරීක්ෂා කළ යුතුය. එසේ වුවද, මණ්ඩලය විසින් ලංකා ලුණු සමාගම අත්පත් කර ගැනීමේදී උද්ගත වූ රු. 378,926,440 ක් වූ කීර්තිනාමය, ප්‍රමිතයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ලියාහැර තිබුණි.

### 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - මණ්ඩලය

----------------------------------------------------

#### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

-----------------------------------

ප්‍රමිතයේ 49 වන වගන්තිය ප්‍රකාරව, ඉකුත් කාලපරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීමේදී, වරදේ ස්වභාවය, නිවැරදිකරන ප්‍රමාණය හා නිවැරදි කිරීම් බලපානු ලබන අයිතමයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මණ්ඩලයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සාමාජික අරමුදලට 2015 හා 2016 වර්ෂවලදී සිදු කර තිබූ පිළිවෙලින් රු. 2,815,000 ක් හා රු. 16,607,000 ක් වූ පෙර වර්ෂ වල ගැලපීම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 51 වගන්තිය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කල යුතුය. එහෙත් මණ්ඩලය ඒ අනුව කටයුතු කිරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 441,853,000 ක් වූ ජංගම නොවන වත්කම් තුළ වර්ෂ 25 කට අධික කාලයක සිට හීනවන ශේෂ ක්‍රමය යටතේ තවදුරටත් ක්ෂය වෙමින් පවතින වත්කම් පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

(i) ප්‍රමිතයේ 58 වන වගන්තිය ප්‍රකාරව, ව්‍යවසාය විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම හානිකරණ අලාභයක් ඇති බවට සාධාරණ සාක්ෂි තිබේද යන්න පිළිබඳ තක්සේරුවක් කළ යුතු විය. එසේම, 61 වන වගන්තිය ප්‍රකාරව ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට වඩා අඩු බවට වැදගත් හා දිගුකාලීන පරිහානියක් තිබේ නම් එය සාධාරණ සාක්ෂියක් ලෙස හඳුනාගත යුතු විය. ඒ අනුව මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව සෑම මූල්‍ය වර්ෂයකදීම ඉහත ප්‍රමිතය ප්‍රකාරව හානිකරණ අලාභයන් පිළිබඳ තක්සේරුවක් සිදු කළයුතු වුවත් මණ්ඩලය විසින් 2016 මූල්‍ය වර්ෂය සඳහා එවැනි තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන්ගේ සාධාරණ අගය එහි පිරිවැයට සාපේක්ෂව සියයට 30 සිට සියයට 67 දක්වා අඩු වූ අවස්ථා 9 ක් පැවති අතර ඊට අදාළ හානිකරණ අලාභ රු. 295,655,000 ක් විය. එහෙත් රු. 282,739 ක් වූ හානිකරණ අලාභයක් පමණක් 2016 වර්ෂයේදී ගැලපීම් කර තිබීම හේතුවෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කර නොතිබූ හානිකරණ අලාභය රු. 295,372,261 ක් විය.

**2.3.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

මණ්ඩලයේ 2016/2017 තක්සේරු වර්ෂය සඳහා සකස් කරන ලද බදු වාර්තාව අනුව, 2016 දෙසැම්බර් 31 දිනට දළ බදු බැදියාව හා ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ බදු බැදියාව අතර රු. 107,093,775 ක වෙනසක් විය. එමෙන්ම ආදායම් බදු වාර්තාව අනුව හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු බදු බැදියාව අතර රු. 43,663,000 ක වෙනසක් විය. එසේ වුවද, මණ්ඩලය විසින් එම නොසැසඳුණු ශේෂ සම්බන්ධයෙන් වූ සැසඳුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

**2.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| අයිතමය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (i) ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ | 200,000,000 | ප්‍රත්‍යාගණන වාර්තාව |
| (ii) භාණ්ඩාගාර බැඳුම්කර අගය කිරීමේ වරද නිවැරදි කිරීම | 74,995,000 | අදාල විස්තරාත්මක වාර්තා හා උපලේඛන |

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයට පෙර වර්ෂවලට අදාළව උසස් පෙළ සමතුන්ට ගෙවියයුතු හිමිකම් නොපෑ ශිෂ්‍යත්ව මුදල් රු. 2,113,000 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පවතින හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු. 9,992,462 ක්ද, 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු. 16,087,267 ක්ද හා ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ රු. 5,310,499 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. 31,390,228 ක් පැවති අතර 2017 මැයි 31 දින වනවිටරු. 2,800,844 ක් පමණක් අදාළ ප්‍රතිලාභීන් වෙත නිරවුල් කර තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත | (i) | මණ්ඩලය සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන අතර ඒ අනුව සේවකයන්ට හිමි වාර්ෂික නිවාඩු සංඛ්‍යාව 14 ක් හා අනියම් නිවාඩු 07 ක් වශයෙන් උපරිම 21 ක් වුවද, ඊට පටහැනිව වාර්ෂික නිවාඩු 42 ක් ලබාදී තිබුණි. |
| | (ii) | පනත ප්‍රකාරව, අතිකාල සඳහා ගෙවීම් කිරීමේදී සාමාන්‍ය පැයක වේතනය මෙන් එකහමාරක් ගෙවිය යුතු වුවද, ඊට පටහැනිව මණ්ඩලය අතිකාල පැයකට පැය එකහමාරක් සමග දිනක වැටුපක්ද එකතුකර අතිකාල ගෙවා තිබුණි. ඒ අනුව මණ්ඩලයේ 2016 වර්ෂයේ අතිකාල පිරිවැය රු. 16,312,000 ක ඉහල අගයක් ගෙන තිබුණි. |
| | (iii) | අතිකාල සඳහා හිමිකම් ලැබීමට නම් සාමාන්‍ය උපරිම කාලය වන සතියකට පැය 45 කට වඩා වැඩියෙන් සේවය කළ යුතුය. එසේ වුවද, මණ්ඩලය විසින් සතියකට පැය 45 උපරිමය සලකා බැලීමකින් තොරව දිනකට පැය 8 ඉක්මවන සෑම පැයකටම අතිකාල ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමුහයේ ලාභය රු.මිලියන 14,349 ක් හා මණ්ඩලයේ ලාභය රු. මිලියන 13,651 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 11,873 ක් හා රු.මිලියන 11,990 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 2,476 කින් හා රු.මිලියන 1,661 කින් වර්ධනය වී තිබුණි. මණ්ඩලයේ පොලී ආදායම් රු.මිලියන 3,218 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. කෙසේ වුවද, මෙම වාර්තාවේ 2.3.1 (ඇ) (ii) ඡේදයෙහි දක්වා ඇති විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභය වූ රු. 295,372,261 ක් සැලකිල්ලට ගත්විට ලාභයේ සත්‍ය වර්ධනය එම ප්‍රමාණයෙන් අඩුවිය යුතුය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මණ්ඩලයේ ලාභය අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර 2012 දී රු. 7,958,000,000 ක්වූ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු. 13,651,165,000 ක් වී තිබුණි. එසේම මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ආදායම් බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී දී රු.8,776,771,000 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.17,052,574,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2.3.1(ඇ) (ii) හි දැක්වෙන පරිදි හානිකරණ අලාභය ගැලපීමෙන් පසු හා සමාලෝචිත වර්ෂයේ ලාභයට පසුගිය වර්ෂයේ ලාභයෙන් එකතු කරන ලද රු. 3,317,869,000 ක ප්‍රමාණය ඉවත් කළ විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ දී ගෙවිය යුතු වන සියයට 3 බැගින් වන අනිවාර්ය පොලී ගෙවීම් හා 14 වන වගන්තිය අනුව ප්‍රකාශ කරන ලද සියයට 6 බැගින් වන ලාභාංශ ප්‍රතිලාභ ගෙවූ පසු ඉදිරියට ගෙන යන ශුද්ධ අලාභය රු. 163,743,261 ක් විය. එය මණ්ඩලයේ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයට අවාසි සහගත බලපෑමක් ඇති නොකරනු ඇතැයි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) වර්ෂයේ මුළු ආදායම වර්ෂයේ ආරම්භක දිනට ඇති අරමුදලේ වටිනාකම සමග සැසඳීමේදී 2016 හා 2015 වර්ෂවල සියයට 11.24 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණු අතර වර්ෂයේ ලද ශුද්ධ දායක මුදල් හා ආරම්භක සාමාජික අරමුදලට සාපේක්ෂව සියයට 10.8 ක් විය.

(ඇ) මණ්ඩලයේ මෙහෙයුම් ලාභ අනුපාතය 2016 වර්ෂයේදී හා 2015 වර්ෂයේදී සියයට 89 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

(ඈ) 2015 ජනවාරි මාසයට සාපේක්ෂව 2016 ජනවාරි මාසය වනවිට මණ්ඩලයේ සාමාජික අරමුදලේ හා දළ ආදායමේ වර්ධනය පිළිවෙලින් සියයට 12.7 ක් හා සියයට 12.9 ක් වශයෙන් පැවතුණි.

## 3.3 ආයතනය විසින් හෝ ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලය විසින් ගෙවා තිබූ රු. 21,900,000 ක වන්දි මුදලක් ආවරණය කර ගැනීම සඳහා සහ අයවීමට තිබූ රු. 1,902,318 ක බදු මුදලක් අයකර ගැනීම සඳහා බාහිර ආයතන 2 කට එරෙහිවද රු. 242,887,355 ක දායක මුදල් හා අධිභාර අයකර ගැනීම වෙනුවෙන් දිවයින පුරා අධිකරණවල නඩු 2,415 ක්ද ගොනුකර තිබුණි. එසේම බාහිර ආයතන විසින් රු. 16,292,987 ක අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව නඩු 18 ක් අධිකරණවල ගොනු කර තිබුණි. තවද ඒවායේ ස්වභාවය, වර්තමාන තත්ත්වය යනාදිය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව, මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගිවීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම, ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවා තිබුණි.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනතේ 7 වන වගන්තියෙන් සංශෝධිත 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ස්වයං රැකියාලාභීන් බඳවාගැනීමට ඉඩකඩ සලසා දී තිබුණි. එසේ වුවත්, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ස්වයං රැකියාලාභීන් ලෙස වාර්තා වී ඇති සංඛ්‍යාව 2,511,568 ක් පමණ වුවත් මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ඉන් බඳවා ගැනීමට හැකිවී තිබුණේ සාමාජිකයන් 39,629 ක් හෙවත් මුළු සංඛ්‍යාවෙන් සියයට 1.58 ක් පමණක් විය. 2016 වර්ෂය තුළ ස්වයං රැකියාලාභීන්ගෙන් ලැබුණු දායක මුදල රු.43,716,657 ක් වන අතර, එය එම වර්ෂයේ මුළු දායක ලැබීම්වලින් සියයට 0.22 ක් පමණ විය. 1989 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ස්වයං රැකියාලාභීන්ගෙන් ලද මුළු දායක මුදල රු.277,457,066 ක් වන අතර, එය 2016 ආරම්භයට පැවති සාමාජික අරමුදලින් සියයට 0.13 ක් විය. අරමුදල් පනත මගින් විශේෂයෙන් නියම කර ඇති මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය තුළ වෙනම අංශයක් ස්ථාපිත කර ක්‍රියාකාරී සැලැස්ම තුළ උපායමාර්ග දක්වා තිබුණද, ඉහත නිරීක්ෂණ අනුව 2016 වර්ෂය අවසන් වන විටත් ඒ සඳහා දක්වා තිබූ අවධානය අවම මට්ටමක පැවතුණි.

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව, ප්‍රකාශකළ යුතු අනිවාර්ය පොලිය සියයට 3 හා 14 වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශ කරන ලද සියයට 6 ක ලාභාංශ ප්‍රතිශතය සමග මුළු ප්‍රතිලාභය සහ සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී එම ගෙවීම් මූල්‍යයනය කරගත් ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 වර්ෂයේ දී සාමාජිකයන්ට පොලී හා ලාභාංශ වශයෙන් සියයට 12.5 ක් ප්‍රකාශ කර තිබූ අතර 2015 හා 2016 වන විට එම ප්‍රතිශතය සියයට 9 දක්වා වර්ෂ 5 ක් තුළදී සියයට 3.5 කින් අඩු වී තිබුණි.

(ii) මණ්ඩලයේ සාමාජික අරමුදල අඛණ්ඩව වර්ධනය වුවද, වර්ෂය තුළ උපයන ලාභය වර්ධනය නොවීම හේතුවෙන් සාමාජික ප්‍රතිලාභ ගෙවීම සඳහා දිගින් දිගටම රඳවා ගත් ලාභ හෝ සංචිත භාවිතා කිරීමට සිදුවී තිබුණි. ඒ අනුව පොලී හා ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් ලාභයක් ප්‍රවර්තන වර්ෂයේ දී උපයා නොමැති වීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ලාභාංශ සම කිරීමේ සංචිතයෙන් රු. 3,858,000,000 ක් ලබාගෙන තිබුණි. මේ හේතුවෙන් 2010 වර්ෂයේදී රු. 4,000,000,000 ක්ව පැවති ලාභාංශ සම කිරීමේ සංචිතය 2016 වනවිට රු. 142,000,000 ක් දක්වා පහත බැස තිබීමෙන් මණ්ඩලයේ සාමාජිකයන්ට අනාගතයේදී ප්‍රතිලාභ ගෙවීමේදී අවදානමකට මුහුණ දීමට සිදුනොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විණි. තවද, 2015 වර්ෂයට අදාළ සියයට 9 ක් වූ ප්‍රතිලාභ පියවීම සඳහා රඳවාගත් ලාභවලින් රු. 37,550,000 ක් ද භාවිතා කර තිබුණි.

(iii) 2014 වර්ෂයේ රු. 17,624,426,000 ක් වූ පොලී හා ලාභාංශ මුල්‍යායනය කිරීමට එම වර්ෂයේ උපයන ලද ලාභය යොදා ගත් පසු ලාභාංශ සම කිරීමේ සංචිතයෙන් ලබාගත යුතු වූයේ රු. 492,167,000 ක් වුවද, එම වර්ෂයේ දී ලාභාංශ සම කිරීමේ සංචිතයෙන් රු. 515,000,000 ක් ලබාගෙන තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සාමාජික සුබසාධන ප්‍රතිලාභ ක්‍රම දහයක් පමණ ක්‍රියාත්මක කරන අතර සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 3 ක තොරතුරු සැලකීමේදී සුබසාධන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබන සාමාජික සංඛ්‍යාව මුළු සාමාජික සංඛ්‍යාවෙන් 2015 වර්ෂයේදී හා 2016 වර්ෂයේදී පිළිවෙලින් සියයට 0.41 ක් හා සියයට 0.57 ක් වැනි සුළු ප්‍රතිශතයක් වුවද ඒ සඳහා දරා ඇති වියදම මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 22 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) සංයුක්ත සැලැස්මට අනුව, තොරතුරු තාක්ෂණ අංශය විසින් වර්තමානයේ පවතින සාමාජික ගිණුම් කළමනාකරණ පද්ධතිය හා අනෙකුත් මෘදුකාංග පද්ධති පිළිබඳව අධ්‍යයනයකර නව මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීමටත්, ආපදා වළක්වා ගැනීමේ සැළසුම ක්‍රියාත්මක කිරීමටත් සැළසුම් සකස් කර තිබුණද එම කාර්යයන් 2016 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

**4.2 අරමුදල් ආයෝජනය**
**-----------------------**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමේදී ආයෝජනය කළයුතු පරිනත කාලසීමාව (tenor), ඵලදා අනුපාතය හා මුදල සම්බන්ධ ආයෝජන උපදේශන කාර්යය සඳහා 2015 ජූලි මාසයේ සිට පෞද්ගලික අරමුදල් කළමනාකරණ ආයතනයක සහාය ලබාගෙන තිබුණද දෙපාර්ශවය අතර ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2016 වර්ෂය තුළ එම ආයතනයේ උපදේශන සහාය ඇතිව සිදුකළ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික හා ද්විතියීක වෙළඳපොල මිලදී ගැනීම් වල මුහුණත වටිනාකම රු. 24,055,225,802 ක් විය. ලිඛිත ගිවිසුමක් රහිතව සහ ගාස්තු අයකිරීමකින් තොරව ලබාදෙන උපදෙස් වල නීතිමය වලංගුභාවය සහ මණ්ඩලයට අදාළ වැදගත් මූල්‍ය තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කරගැනීම පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් මේ තුළින් මතු නොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකිවිණි.

ඉහත සඳහන් පෞද්ගලික අරමුදල් කළමනාකරණ ආයතනයේ උපදෙස් මත සිදුකර තිබූ ආයෝජන සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා මිල ගණන් කැඳවූ සාර්ථක අවස්ථා 22 ක් අතරින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ලංසු සියයට 100 ක්ම ප්‍රතික්ෂේප වූ අවස්ථා 13 ක් පැවතිණි. එම ප්‍රතික්ෂේප වූ බැඳුම්කර සඳහා වූ ද්විතියික වෙළඳපොළ ඵලදා අනුපාතයන්

පිළිබඳව සලකා බැලීමේදී පවත්නා වෙළඳපොල තත්ත්වයන් පිළිබඳව නිසි අධ්‍යයනයකින් තොරව ඉහල ඵලදා අනුපාතයන් යටතේ ලංසු ඉදිරිපත් කිරීම හේතුවෙන් ප්‍රාථමික වෙළඳපොළ තුළ ඉදිරිපත් කල මිල ගණන් ප්‍රතික්ෂේප වී තිබුණි. එබැවින් ප්‍රාථමික වෙළඳපොළ තුළ ආයෝජනය කිරීමෙන් ලබා ගැනීමට හැකිව තිබූ මූල්‍ය වාසි අහිමි කරගෙන තිබුණි.

(ආ) 2016 මැයි හා ජුනි මාසවලදී නිකුත් කරන ලද ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක LKB01226F014 න් මණ්ඩලය විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් රු.මිලියන 2,200 ක බැඳුම්කර සියයට 12.6 ත් සියයට 13.5 ත් අතර ඵලදා අනුපාතයකට මිලදී ගැනීමට අයදුම්කර තිබූ නමුත් එම සියළු ලංසු ප්‍රතික්ෂේප වී තිබුණි. කෙසේ නමුත්, එම අංක දරන බැඳුම්කරයම සියයට 11.8 ත් සියයට 12.8 ත් අතර වූ අඩු ඵලදා අනුපාත යටතේ 2016 මැයි, ජුනි හා ජුලි මාසවලදී රු.මිලියන 1,927 ක් වැයකර ද්විතියික වෙළඳපොළෙන් මිලට ගෙන තිබුණි. එසේම, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක LKB01025C157 න් රු.මිලියන 2,100 ක බැඳුම්කර 2016 ජුනි මාසයේදී ප්‍රාථමික වෙළඳපොලෙන් මිලදී ගැනීමට සියයට 12.7 ත්, සියයට 13.26 ත් අතර ඵලදා අනුපාතයක් යටතේ අයදුම්කර තිබූ නමුත් එම ලංසු ද ප්‍රතික්ෂේප වී තිබුණි. නමුත් එම අංක දරන බැඳුම්කරයම සියයට 12.25 ත්, සියයට 12.58 ත් අතර වඩා අඩු ඵලදා අනුපාතයක් යටතේ 2016 ජුලි මාසයේදී රු.මිලියන 416 ක් වැයකර ද්විතියික වෙළඳපලෙන් මිලට ගෙන තිබුණි. මේ අනුව, මණ්ඩලය විසින් සාධාරණ මිල ගණන් ඉදිරිපත් කර ප්‍රාථමික වෙළඳපොලෙන් සෘජුව මිලදී ගැනීමට තිබූ අවස්ථාවන් අහිමි වී තිබූ අතර අඩු ඵලදාවක් සහිතව ද්විතියික වෙළඳපලෙන් එම බැඳුම්කරම මිලට ගැනීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසි මණ්ඩලයටත් සාමාජිකයින්ටත් අහිමි වී තිබුණි.

(ඇ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික වෙළඳපොලෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමට අයදුම් කිරීමේදී ඉදිරිපත් කරන ඵලදා අනුපාතයන් ඒ හා සමාන ක්ෂේත්‍රයක නියැලී සිටින අරමුදලක් විසින් ඉදිරිපත් කරන ඵලදා අනුපාතයන් සමග සැසඳීමේදී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ඉතා ඉහල ඵලදා අනුපාතයන් ඉදිරිපත් කිරීම හේතුවෙන් ආයෝජන අවස්ථා අහිමිකර ගෙන තිබූ අවස්ථා පහත දැක්වේ.

| මිලදී ගැනීමේ දිනය | ජාත්‍යන්තර සුරැකුම්පත් අංකය | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - ප්‍රතික්ෂේප වූ වටිනාකම (රු.මිලියන) | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - ඵලදා අනුපාතය (%) | සමාන ක්ෂේත්‍රයේ නියැලී සිටින අරමුදල - පිළිගත් බැඳුම්කර වටිනාකම (රු.මිලියන) | සමාන ක්ෂේත්‍රයේ නියැලී සිටින අරමුදල - ඵලදා අනුපාතය (%) |
|---|---|---|---|---|---|
| 11/01/2016 | LKB01025H016 | 1,300 | 11.13-11.49 | 1,000 | 11.10 |
| 01/03/2016 | LKB00821H019 | 605 | 11.6-12.2 | 1,000 | 11.4 |
| | | | | 2,000 | 11.45 |
| 16/05/2016 | LKB01024A014 | 440 | 12.2-12.5 | 1,000 | 12.10 |

(ඈ) මණ්ඩලය විසින් ප්‍රාථමික හා ද්විතියික වෙළඳපොළ හරහා මිලට ගනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර "පරිණත වීම තෙක් රඳවාගන්නා බැඳුම්කර" ලෙස වර්ගකර පවත්වා ගන්නා බැවින් ඒවා ද්විතියික වෙළඳපොළ තුළ විකිණීමෙන් ලබාගත හැකි මූල්‍ය වාසි අත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී ඍජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Dealership) මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අත්කර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් ද්විතියික වෙළඳපොළ හරහා භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම් පිළිබඳ පරීක්ෂාවේදී ප්‍රාථමික ගනුදෙනුකරුවන් 08 දෙනෙකු සමග එම ගනුදෙනු සිදුකර තිබූ අතර භාණ්ඩාගාර මිලදී ගැනීම්වලින් ඉහළම ප්‍රතිශතයක් එනම් සියයට 41 ක් මතභේදයකට තුඩු දී තිබූ එක් පෞද්ගලික ආයතනයක් සමග සිදු කර තිබුණි. තවත් සියයට 40 ක් වෙනත් පෞද්ගලික ආයතනයක් සමග සිදු කර තිබුණි. අනෙකුත් ප්‍රාථමික ගනුදෙනුකරුවන් හය දෙනෙකු සමග සිදුකර තිබූ සියලුම මිලදී ගැනීම් සියයට 19 ටත් වඩා අඩු මට්ටමක පැවතිණි.

(උ) 2016 සැප්තැම්බර් 13 වන දින පැවති භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේදී දින 364 කින් කල්පිරෙන බිල්පත්වල මණ්ඩලය සියයට 10.35 ක ඵලදා අනුපාතයකට රු.මිලියන 4,000 ක් ආයෝජනය කර තිබුණි. විකල්ප ආයෝජන අවස්ථා (ණයකර/ස්ථාවර තැන්පත්) පිළිබඳව නිසි අධ්‍යයනයකින් තොරව අඩු පොලී අනුපාතයකට ඉහත ආයෝජනය සිදු කර තිබීමෙන් මණ්ඩලයට ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසි අහිමි කරගෙන නොතිබුණි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විණි.

2016 සැප්තැම්බර් 12 දින මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු නියෝගයක් මත ඉහත ආයෝජනය කිරීමට සිදුවූ බවත් එම ආයෝජනය පිළිබඳව පූර්ව අධ්‍යයනයක් කිරීමේ අවස්ථාවක් නොමැති වූ බවත් මණ්ඩලයේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පලටුපාන ලේවාය සහිත භූමිය ලංකා ලුණු සමාගමට රජය විසින් පවරා දීමට අදාළ බදු ගිවිසුමේ අංක 09 දරන වගන්තිය අනුව, ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව අදාළ ඉඩම හෝ එහි ගොඩනැගිලි පරිපාලිත සමාගමේ කටයුතු සඳහා හැර වෙනත් කිසිදු කටයුත්තකට භාවිතා කිරීම නොකළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, පරිපාලිත සමාගම විසින් මණ්ඩලයේ ක්‍රීඩා සංගමයට නිවාඩු නිකේතනයක් ඉදිකිරීමට පර්චස් 80 ක් පවරා දී තිබුණි. ක්‍රීඩා සංගමයට එම ඉඩමේ නිවාඩු නිකේතනය ඉදිකිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් 2012 හා 2013 වර්ෂයන්හිදී රු. 3,000,000 ක ණය මුදලක් කිසිදු නීතිමය පදනමකින් තොරව සියයට 10 ක පොලී අනුපාතයකට වාරික 24 කින් පියවීමට ලබාදී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක තැන්පත් කරන චෙක්පත් සඳහා පසු දිනම මුදල් බැර කිරීමේ පහසුකම ලබාදීම වෙනුවෙන් 2006 වර්ෂයේ දී දෙපාර්ශවය අතර ඇතිකරගත් එකඟතාවයකට අනුව මණ්ඩලය විසින් රු.500,000,000 ක මූලික තැන්පතුවක් අදාළ බැංකුවේ පවත්වාගෙන යනු ලැබේ. වාර්ෂිකව කල්පිරෙන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක් ලෙස පවත්වාගෙන යන එම තැන්පතුව සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණු අතර වාර්ෂික පොලී අනුපාතය තීරණය වන ආකාරය ද ගැටළුකාරී වී තිබුණි. අදාළ සේවාව සැපයීම වෙනුවෙන් බැංකුව විසින් මාසිකව රු.100,000 ක් බැගින් අමතර ගාස්තුවක් අයකර තිබූ අතර දෛනිකව එම ගිණුමේ රු. 5,000,000 ක අවම ශේෂයක් ද පවත්වාගත යුතු විය. එම තැන්පතුවට අදාළ පොලී අනුපාතය 2015/2016 දී සියයට 6.5 ක්ද 2016/2017 දී සියයට 8.9 ක් හා සියයට 10.8 ක් ලෙස ලැබී තිබුණි. ඉහත එකඟතාවය හේතුවෙන් එම මුදල් වැඩි ප්‍රතිලාභ ප්‍රතිශතයක් සහිත ආයෝජනයක යෙදවීමෙන් මණ්ඩලයට ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසි අහිමි වී තිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සමාගම් තුනක ණයකරවල සිදු කළ ආයෝජන වෙනුවෙන් 2006 වර්ෂය දක්වා ලැබිය යුතු රු. 27,497,905 ක පොළී ආදායම එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි. එය අයකර ගැනීමට ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව හෝ අයකරගැනීමට ඇති හැකියාවේ ස්වභාවය හෝ සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ප්‍රකාරව ප්‍රතිපාදනයක් හෝ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ සේවකයන්ට නවාතැන් ගැනීමට මණ්ඩලයේ වියදමින් පවත්වාගෙන යනු ලබන සංචාරක නිවාසවලින් 2016 වර්ෂයේ ලැබූ ශුද්ධ අලාභය රු.2,817,000 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී ලැබූ ශුද්ධ අලාභය රු. 2,938,000 ක් වී තිබීම මණ්ඩලයේ සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම සඳහා පවතින අරමුදල් අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

(ඇ) මණ්ඩලය ඒකක භාර අරමුදල් තුනක සිදුකර ඇති ආයෝජනවල 2014 දෙසැම්බර් 31 දිනට රු. 356,426,847 ක් වූ වෙළෙඳපොළ වටිනාකම 2015 දෙසැම්බර් 31 දින වන විට රු.21,696,000 කින්ද, 2016 දෙසැම්බර් 31 දින වන විට රු. 3,846,000 කින්ද පහත වැටීම නිසා එම ප්‍රමාණයෙන් අලාභයන් සිදුව තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් රු. 25,284,181 ක් ආයෝජනය කරන ලද සමාගම් 03 ක් අතුරින් සමාගම් දෙකක් ඈවරකර තිබූ අතර ඉතිරි සමාගම කඩවුණු පුවරුව (Default Board) යටතේ දක්වා තිබුණි. ඈවරකිරීමට ලක්ව ඇති ආයතන දෙක සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණද, ආයෝජනයන්ගේ වටිනාකම නැවත අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි.

(ඉ) වනික් සමාගමේ පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබුණු රු.12,174,382 ක් හා ණයකරවල ආයෝජනය කර තිබුණු රු. 7,450,259 ක් පිළිවෙලින් 2002 හා 2007 වර්ෂවලදී උපලබ්ධි වියයුතුව තිබූ නමුත්, එම මුදල් උපලබ්ධි කර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් මණ්ඩලයට හැකි වී නොතිබුණි.

(ඊ) මණ්ඩලයේ සාමාන්‍ය කොටස්වල ආයෝජනයන්ගේ 2016 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. 12,095,980,000 ක් වූ අතර, 2017 මාර්තු 31 දින වන විට ධාරණ අගය රු. 465,748,000 කින් හෙවත් සියයට 4 කින් පහත වැටී තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ප්‍රධාන විධායක තනතුරක් වන සාමාන්‍යාධිකාරී තනතුර 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුර පුරප්පාඩුව පැවතීම මණ්ඩලයේ පරිපාලන කටයුතුවලට හා ඉහළ කළමනාකරණ අධීක්ෂණයට සෘජු බලපෑමක් සිදු කර තිබුණි. එමෙන්ම මණ්ඩලයේ ආයෝජන කළඹ මෙහෙයවීම හා පාලනයට අවශ්‍ය උපදෙස් ලබාදීමට වරලත් මූල්‍ය උපදේශකයෙකු බඳවා නොගැනීම ප්‍රශස්ත ආයෝජන සම්බන්ධ තීරණ ගැනීමේදී බලපෑමක් ඇති නොවිණි යන්න විගණනයේදි බැහැර කළ නොහැකි විණි. මෙම තත්ත්වය අරමුදල් ආයෝජන සම්බන්ධව වූ 4.2 ඡේදයේ නිරීක්ෂණ වලින්ද වඩාත් තහවුරු වී තිබුණි.

**4.6 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මණ්ඩලය විසින් සේවාදායක ආයතනවලින් අයකරගෙන තිබූ එකතුව රු. 1,764,995,612 ක් සහ 1996 සිට 2002 කාල පරිච්ඡේදයට අදාළ හඳුනා නොගත් රු.1,228,101 ක දායක මුදල්, අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන තිබුණි. මේ හේතුවෙන් අදාළ සාමාජිකයන්ට තම මුදල් අහිමි වීමේ අවදානමක් පැවතුණි. මෙම මුදල් අප්‍රමාදව සාමාජික ගිණුම්වලට බැර කිරීම සඳහා විශේෂ ඒකකයක් 2016 පෙබරවාරි 10 දින ස්ථාපිත කර තිබුණද 2017 මාර්තු 01 සිට 2017 ජුනි 30 දින දක්වා ඉන් රු. 137,000,000 ක් පමණක් නිරවුල් කර තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් තාවකාලික ලියාපදිංචි අංක ලබාදී අනුව්‍යාජ (Dummy) සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර එම දායක මුදල් 'XX' නමින් ගිණුමක පවත්වාගෙන යනු ලැබේ. 1984 වර්ෂයේ සිට එලෙස ලියාපදිංචි කරගෙන තිබූ අනුව්‍යාජ සේවායෝජකයින් සංඛ්‍යාව 2017 මැයි 31 දින වනවිට 14,232 ක් වී තිබුණි. ඒ අනුව, අදාළ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර 'XX' ගිණුමේ 2017 මැයි 31 දිනට පවතින ශේෂය රු. 140,265,923 ක් වන අතර 2016 වර්ෂය තුළදී පමණක් එම සේවායෝජකයින්ගෙන් අයකර ගත් දායක මුදල් හා අධිභාර මුදල් වල වටිනාකම රු. 45,189,980 ක් විය. මෙලෙස අනුව්‍යාජ සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගන්නා සේවායෝජකයින් මණ්ඩලයේ සත්‍ය සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සේවක අර්ථසාධක අරමුදල සමග සම්බන්ධ වී සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයේ මාසික ගිණුම් පිළිබඳව මාසිකවද, වාර්ෂික ගිණුම, අයවැය, වාර්ෂික වාර්තාව, සංයුක්ත සැළැස්ම පිළිබඳව වාර්ෂිකවද, සභාපති විසින් පවරන ලද විමර්ශනයන් ද කළ යුතු වුවත්, ඒ සම්බන්ධව කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණනය මගින් අරමුදලේ ප්‍රධාන කාර්යභාරය වන අරමුදල් ආයෝජනය හා එහි ප්‍රතිලාභ වැනි ක්ෂේත්‍ර ආවරණය කිරීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ ඍජුව විගණන කටයුතු හා සම්බන්ධ වන කාර්ය මණ්ඩලය 34 කට සීමා වී තිබූ අතර ඉන් උපාධි, පූර්ණ හෝ අර්ධ වෘත්තීය සුදුසුකම් ලත් සංඛ්‍යාව 09 දෙනෙකු විය. 2016 දෙසැම්බර් 31 වන විට රු. 249,089,083,000 ක ශුද්ධ වත්කමක් පවතින ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට ප්‍රමාණවත් සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් නොසිටීම එහි විෂය පථය සීමා වීමට බලපා තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ 2016 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් සැසඳීමේදී ආදායම් ශීර්ෂ අතර සියයට 25 සිට සියයට 96 දක්වා වූ විචලනයන් පැවති අවස්ථා 06 ක් නිරීක්ෂණය විය. එහිදී මිල ප්‍රකාශිත කොටස් මත ලාභාංශ හා මුදල් වෙළඳපොල තැන්පත් පොලී පිළිවෙලින් සියයට 96 ක් හා සියයට 29 ක් වශයෙන් අයවැයගත ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේ අයවැයගත හා තත්‍ය වියදම් සැසඳීමේදී සියයට 25 ත් සියයට 50 ත් අතර විචලනයන් නිරීක්ෂණය වූ වියදම් අයිතම 16 ක් ද සියයට 50 ත් සියයට 202 ත් අතර විචලනයක් නිරීක්ෂණය වූ අයිතම 13 ක්ද පැවතුණි. එහිදී නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් පොලී පිරිවැය, කාර්යාලීය නඩත්තු හා අවශ්‍යතා, විවිධ වියදම් සහ ගොඩනැගිලි නඩත්තු වියදම් පිළිවෙලින් සියයට 66, සියයට 130, සියයට 71 සහ සියයට 53 බැගින් අයවැයගත ප්‍රමාණයට වඩා වැඩිවී තිබූ අතර මුළු සාමාජික වියදම සියයට 39 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැළකිය යුතු විචලනයන් පැවතීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

මණ්ඩලය විසින් 2016 වර්ෂය වෙනුවෙන් සිදුකර තිබූ රු. 16,252,053 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 5 ක් සම්බන්ධයෙන් විෂය පිළිබඳ විශේෂඥයකු හා රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයකු තාක්ෂණික ඇගයීම් කමිටුව නියෝජනය නොකිරීම, ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල නොකිරීම, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබීම, ලංසු වල වලංගු කාලය සඳහන් නොකිරීම හා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබීම ඇතුළු අඩුපාඩු හේතුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ), 2.8.4, 4.2.2 (අ), 4.3.1, 4.3.2, 5.2.1 (අ), 5.3.10 හා 8.9.1 යන වගන්ති උල්ලංඝණය කර තිබූ බව නිරීක්ෂණය විය.

## 5.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක නොකිරීම

මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයාම වන අතර එය මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිවරයාම විය යුතු බවටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවටත් 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී නිර්දේශ කර තිබුණි. එසේ වුවද, 2017 මැයි 31 වන විටත් ඊට අදාළ සංශෝධන සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ | |
| --- | --- | --- | --- |
| (අ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවූ අවස්ථා පැවතීම. | |
| (ආ) | මෙහෙයුම් පාලනය | සේවාදායකයින්ගෙන් එකතු කරන මුදල් සාමාජිකයන්ගේ ගිණුම්වලට අප්‍රමාදව බැර නොකිරීම. | |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | (i) | සේවාදායකයින්ගෙන් එකතු කර ගන්නා මුදල් ඉහල සුරක්ෂිතතාවයක් හා වැඩි ප්‍රතිලාභයක් ලැබෙන අයුරින් ආයෝජනය නොකිරීම. |
| | | (ii) | ආයෝජිත අරමුදල් ඇගයීම කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| (ඈ) | අයවැය පාලනය | අයවැයගත ආදායම් හා වියදම් වලට අනුගතව කටයුතු නොකිරීම. | |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. | |